**ඔපෙක් අරමුදලින් මුල්‍යයනය කරන බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - 2021**

ඔපෙක් අරමුදලින් මුල්‍යයනය කරන බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ පෙර තෝරාගත් ජාතික මාර්ගවල කිලෝමීටර් 27 ක් වැඩිදියුණු කිරීම, සංවර්ධනය කිරීම හා පුළුල් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 3,232.5කට සමාන එ.ජ.ඩො. මිලියන 24.87ක් වන අතර ඉන් රු.මිලියන 2,209.84කට සමාන එ.ජ.ඩො. මිලියන 17ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල විසින් ලබාදීමට එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි ඉදිකිරීම් කටයුතු 2017 ඔක්තෝබර් 05 දින ආරම්භ කරන ලද අතර 2019 ජුනි 28 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘතියේ කටයුතු 2022 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල රු.මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|---|
| (අ) | දැනටමත් ප්‍රතිලබ්ධි කරන ලද රු.මිලියන 31.89ක මුදල මූල්‍ය ප්‍රකාශනවල විදේශාධාර යටතේ වාර්තා කිරීමකින් තොරව ප්‍රතිලබ්දි කළ හැකි විදේශාධාර යටතේ ලෙස දක්වා තිබුණි. | 31.89 | ව්‍යාපෘතියේ ආරම්භක අදියරේ සිට ණය මුදලින් කරන ලද ප්‍රතිලබ්ධීන් රාජ්‍ය ගිණුම් | 2021 දෙසැම්බර් 31 දිනට නිවැරදි ණය ශේෂය දැක්වීම සඳහා ව්‍යාපෘතියේ සත්‍ය ප්‍රතිලබ්ධි කරන ලද මුදල වාර්තා කිරීමට |

| | | | | |
|---|---|---|---|---|
| | | | දෙපාර්තමේන්තුවේ වාර්තා මත පදනම්ව ගිණුම්ගත කර තිබුණි. එය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වාර්තාවල නොතිබීම හේතුවෙන් රු.මිලියන 31.28ක මුදල ප්‍රතිලබ්දි කළ හැකි විදේශාධාර ගිණුමේ වාර්තා කර ඇත. | පියවර ගත යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් මාසය සඳහා අතුරු ගෙවීම් සහතික අංක 36 වෙනුවෙන් කරන ලද නිවැරදි නොවන වෙන්කිරීම් හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන්ගේ ගෙවීම් ගිණුම රු.මිලියන 18.57කින් වැඩියෙන් දක්වා තිබුණි. | 18.57 | පශ්චාත් කොවිඩ් - 19 තත්ත්වය සහ පුපුරණ ද්‍රව්‍ය හා සිමෙන්ති වැනි අමුද්‍රව්‍යවල හිඟකම හේතුවෙන් කඩුවෙල - අතුරුගිරිය මාර්ග ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉදිකිරීම් ප්‍රගතිය ළඟා කරගත නොහැකි විය. | 2021 දෙසැම්බර් 31 දිනට නිවැරදි වගකීම වාර්තා කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට උපචිත පොළිය ද්විගණනය වීම හේතුවෙන් කඩුවෙල- අතුරුගිරිය මාර්ගයේ ඉඩම් අත්පත් කර ගැනීම මත ගෙවිය යුතු පොළිය සඳහා වෙන්කිරීම රු.මිලියන 15.99කින් වැඩියෙන් දක්වා තිබුණි. | 15.99 | පොළී වියදමේ අදාළ ද්විගණනය ගැලපීමට සටහන් කර ගන්නා ලදි. | වැරුද්ද නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | කඩුවෙල-අතුරුගිරිය මාර්ගයේ ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ ගෙවිය යුතු පොළී රු.මිලියන 69.97ක මුදල 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වන්දි මුදල් ලෙස වැරදියට වාර්තා කර තිබුණි. | 69.97 | පොළී වියදමේ අදාළ ගිණුම්කරණ වැරැද්ද ගැලපීමට සටහන් කර ගන්නා ලදි. | වැරුද්ද නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ඉ) | මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබුණු රු.මිලියන 119.38 දිගුකාලීන ණය මුදල ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. කෙසේවෙතත්, අනුරූපී වටිනාකම මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 119.38 | අදහස් දක්වා නොමැත. | වැරුද්ද නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති ලිපි ලේඛණවලට අනුව, ජාතික මාර්ග 4ක කිලෝමීටර 25.8ක පුනරුත්ථාපන කටයුතු සිදු කිරීමට අපේක්ෂිතවූ අතර ඒ සඳහා කොන්ත්‍රාත් පැකේජ 02ක් යටතේ කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. ණය ගිවිසුම 2015ජුනි 26 වැනි දින අත්සන් කළද කොන්ත්‍රාත් පැකේජ 2හි පුනරුත්ථාපන කටයුතු වර්ෂ 2 1/2ක් ගතවීමෙන් පසු ආරම්භ කර තිබුණි. ප්‍රගති වාර්තා අනුව 2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් පැකේජ - 1 යටතේ කඩුවෙල -අතුරුගිරි මාර්ගයේ සියයට 96.52ක අපේක්ෂිත භෞතික ප්‍රගතියට එරෙහිව සියයට 82.79ක ප්‍රගතියක් පමණක් කොන්ත්‍රාත්කරු අත්කරගෙන තිබුණි.පසුව අරමුදල්වල ඌණතාවය හේතුවෙන් කොන්ත්‍රාත් පැකේජ - 1 යටතේ වල්ගම-අතුරුගිරිය මාර්ගයේ කිලෝමීටර 1.25ක පුනරුත්ථාපන කටයුතු ව්‍යාපෘතියේ විෂය පථයෙන් ඉවත්කර තිබුණි. තවද, 2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් පැකේජ - 11 යටතේ මාර්ග 2ක පුනරුත්ථාපන කටයුතු නිමකර තිබුණි.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ ණය ගිවිසුම එ.ජ.ඩො මිලියන 17ක් සඳහා 2015 ජුනි 26 දින අත්සන් කරන ලද අතර 2019 ජුනි 30 දින අවසන් වේ. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් 2022 සැප්තැම්බර් 30 දක්වා මූල්‍ය ආයතනය විසින් කිහිප වතාවක් ණය අවසන් දිනය දීර්ඝ කර තිබුණි. ණය නැවත ගෙවීම් 2020 ආරම්භ වුවද, 2021 දෙසැම්බර් 31 දිනට මුළු ණය පහසුකමෙන් සියයට 31ක් නියෝජනය කරන එ.ජ.ඩො මිලියන 5.19ක් ප්‍රතිලබ්ධි කිරීමට ව්‍යාපෘතියට නොහැකිවී තිබුණි. | එකගවේ. ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන් සහ වශයෙන් ලං.වි.ම කණු විතැන් කිරීමේ කටයුතු වැනි උපයෝගීතා විතැන් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් සැලසුම් කළ පරිදි කොන්ත්‍රාත් දෙක ඉටුවී නොතිබුණි. ඉහත ත්ත්වය ණය මුදලෙහි අඩු ප්‍රතිලබ්ධිවීම් සඳහා හේතුවිය. | ව්‍යාපෘතියේ කටයුතු නිසි පරිදි සැලසුම් කළ යුතු අතර ණය කාලය අවසන් වීමට පෙර ඒවා නිම කිරීම කඩිනම් කළ යුතුය. |
| (ආ) | පිළිවෙලින් විදේශ ණය සහ ශ්‍රී ලංකා රජයේ වියදම් උපයෝජනය සඳහා 2021 වර්ෂයේ මහා භාණ්ඩාගාරය විසින් රු.මිලියන 450ක සහ රු.මිලියන 85ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතුවල මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් සියයට 16ක් නියෝජනය කරන රු.මිලියන 70.5ක විදේශ ණය මුදලේ ප්‍රතිපාදන සහ සියයට 5ක් නියෝජනය කරන රු.මිලියන 4.1ක ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | එකගවේ. | ව්‍යාපෘතියේ අරමුදල් උපයෝජනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ව්‍යාපෘතියේ කටයුතු නිසි පරිදි සැලසුම් කළ යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත් පැකේජ 2හි රු.මිලියන 1,064ක කොන්ත්‍රාත් පිරිවැයෙන් මුල් වැඩ විෂය පථයට පසුව කරන ලද වෙනස්කම් හේතුවෙන් සියයට 27ක් නියෝජනය කරන | එකගවේ. ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන්, කාණු සහ බිත්ති ගොඩනගන ප්‍රමාණය වැඩිවීම හේතුවෙන් කොන්ත්‍රාත් | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.13.4 වගන්තිය අනුව අනුමැතින් ලබා ගැනීම |

| | | |
|---|---|---|
| රු.මිලියන 291ක් වැඩිවී තිබුණි. කෙසේවෙතත්, 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.13.4 වගන්තිය අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ ප්‍රසම්පාදන කමිටුවේ අවශ්‍ය අනුමැතීන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පැකේජ 11හි මුළු කොන්ත්‍රාත් මුදල වැඩිවී තිබුණි. | අවශ්‍යවේ. |

## 3.3 ඉඩම් අත්පත්කර ගැනීම සම්බන්ධ ගැටලු

| විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|
| ලැබී තිබුණු තොරතුරු අනුව, රජයේ ඉඩම් කට්ටි 458ක් ඇතුළුව ඉඩම් කට්ටි 2,611ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණු අතර ඉන් ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 17 වගන්තිය යටතේ රු.මිලියන 1,412.48ක වන්දි මුදලක් ගෙවා තිබුණි. ඊට අමතරව 2021 දෙසැම්බර් 31 දක්වා වන්දි මුදල් නිරවුල් කිරීමේ ප්‍රමාදයන් මත පොළිය ලෙස එකතුව රු.මිලියන 97.27ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ කිසිදු ඉඩම් කට්ටියක් ලියාපදිංචි කර නොතිබුණි. | එකගවේ. ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 44 උපවගන්තිය අනුව වන්දි ගෙවීම් ප්‍රමාද සඳහා පොළිය ගෙවීමෙන් පසු ඉඩම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත. කෙසේවෙතත්,පොළී ගෙවීමට පෙර ඉඩම් ලියාපදිංචි කිරීමට මෑතකදී තීරණය කර තිබුණි. | ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු කඩිනම් කළයුතු අතර ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ඉඩම් ලියාපදිංචි කළ යුතුය. |